# ලංකා විදුලිබල මණ්ඩලය

## ව්‍යාපෘති අංශය

## ඇබෑර්තු - කොන්ත්‍රාත් පදනම

ලංකා විදුලිබල මණ්ඩලයේ ව්‍යාපෘති අංශයට පහත සඳහන් පුරප්පාඩු සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට පහත සුදුසුකම් හා අත්දැකීම්ලත් ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

### ලිපිකරු - ඇබෑර්තු 02 කි

**සුදුසුකම් හා ඇත්දැකීම් :**

- අ. පො. ස. සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිට සිංහල, ඉංග්‍රීසි හා ගණිතය යන විෂයන් ඇතුළුව සම්මාන සාමාර්ථ 05ක් සහිතව එකවරකදී විෂයන් 06ක් සමත් වීම.
- MS Office පැකේජය පිළිබඳ දැනුම. (MS Word හා MS Excel යන ඒවා විශේෂ වේ) අනෙකුත් පැකේජ පිළිබඳ දැනුම අමතර සුදුසුකමක් වේ.
- ඉංග්‍රීසි භාෂාව භාවිතයෙන් ලිපි සකස් කිරීමේ හැකියාව.
- රාජ්‍ය හෝ පුද්ගලික අංශයේ පිළිගත් ආයතනයක ලිපිකරුවකු ලෙස අවම වශයෙන් වසර 03ක වත් පළපුරුද්දක් ලබා තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.
- අදාල ප්‍රදේශයේ පොලිස් ස්ථානයෙන් ලබා ගත් පොලිස් වාර්තාව සහ ග්‍රාම නිලධාරී සහතිකය සහ වෙනත් සහතික

**අයදුම්පත් ඉදිරිපත් කිරීම :**

ලං.වි.ම. වෙබ් අඩවියේ (https://www.ceb.lk/careers/en) ඇති අයදුම්පත පුරවා අන්තර්ජාලය මගින් ඉදිරිපත් කරන ලෙස අයදුම්කරුවන්ගෙන් ඉල්ලා සිටී. මීට අමතරව, සියලු අයදුම්කරුවන් විසින් තම ජීව දත්ත තොරතුරුද ඇතුලත් කරමින් අත්සන් කරන ලද මුද්‍රිත අයදුම්පත ( සුදුසුකම් වලට අදාල ලියකියවිලි හා සහතික පත්‍ර වල පිටපත් සහිතව ) යොමු කළ යුතු වේ. එසේම ඥාතීන් නොවන පුද්ගලයන් දෙදෙනෙකුගේ නම, ලිපිනය හා සම්බන්ධ කරගත හැකි තොරතුරු ද සහිතව ඉදිරිපත් කළ යුතුය.

### රියදුරු – ඇබෑර්තු 03 කි

**සුදුසුකම් හා අත්දැකීම් :**

- අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිට එක්වරකදී විෂයන් 06 ක් සමත් වීම.
- අයදුම්කරුවන්ගේ අවම උස 5' 3" විය යුතුය
- **අවම වශයෙන් D, C සහ C1 වර්ගයේ වාහන ධාවනය කිරීම සඳහා මෝටර් රථ ගමනාගමන කොමසාරිස් විසින් නිකුත් කරන ලද වලංගු ශ්‍රී ලංකා රියදුරු බලපත්‍රයක් ඇති ශ්‍රී ලාංකික පුරවැසියෙකු වීම.**
- රාජ්‍ය හෝ පුද්ගලික අංශයේ පිළිගත් ආයතනයක රියදුරෙකු ලෙස අවම වශයෙන් වසර 05ක වත් පළපුරුද්දක් ලබා තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.
- **අයදුම්කරුවන් දිවා හා රාත්‍රී රාජකාරියට ශාරීරිකව යෝග්‍ය විය යුතුය.**
- **තෝරාගත් අයදුම්කරුවන්, දර්ශනය සහ ශ්‍රවණය සඳහා මෑතකාලීන පරීක්ෂණ වාර්තා (රජයේ රෝහල්වලින් ලබා ගත්) සම්මුඛ පරීක්ෂණ / රියදුරු පරීක්ෂණය අතරතුර ඉදිරිපත් කළ යුතුය.**
- **අදාළ ප්‍රදේශයේ පොලිස් ස්ථානයෙන් ලබා ගත් පොලිස් වාර්තාව සහ ග්‍රාම නිලධාරි සහතික ඇතුළුව වෙනත් සහතික.**

**අයදුම්පත් ඉදිරිපත් කිරීම :**

ලං.වි.ම. වෙබ් අඩවියේ (https://www.ceb.lk/careers/en) ඇති අයදුම්පත පුරවා අන්තර්ජාලය මගින් ඉදිරිපත් කරන ලෙස අයදුම්කරුවන්ගෙන් ඉල්ලා සිටී. මීට අමතරව, සියලු අයදුම්කරුවන් විසින් තම ජීව දත්ත තොරතුරුද ඇතුලත් කරමින් අත්සන් කරන ලද මුද්‍රිත අයදුම්පත (සුදුසුකම් වලට අදාල ලියකියවිලි හා සහතික පත්‍ර වල පිටපත් සහිතව) යොමු කළ යුතු වේ. එසේම ඥාතීන් නොවන පුද්ගලයන් දෙදෙනෙකුගේ නම, ලිපිනය හා සම්බන්ධ කරගත හැකි තොරතුරු ද සහිතව ඉදිරිපත් කළ යුතුය.

**පහත සඳහන් තොරතුරු සියලුම අයදුම්කරුවන් සඳහා අදාළ වේ.**

**වයස් සීමාව** : ලිපිකරුවන් අයදුම්පත් යොමු කළ හැකි අවසන් දින වන විට අයදුම්කරුගේ වයස අවුරුදු 18 ට නොඅඩු හා 35ට නොවැඩි විය යුතුවේ.

රියදුරන් අයදුම්පත් යොමු කළහැකි අවසන් දින වන විට අයදුම්කරුගේ වයස අවුරුදු 21 ට නොඅඩු හා 35ට නොවැඩි විය යුතුවේ.

**වේතනය** : අයදුම්කරුගේ සුදුසුකම් හා පළපුරුද්ද මත වැටුප් සාකච්ඡා කරගත හැකි අතර එය 2019 මාර්තු 15 දිනැති මුදල් අමාත්‍යංශය විසින් නිකුත් කරන ලද කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2019 ට යටත් වේ.

**තෝරා ගැනීම** : තෝරාගත් අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණ / රියදුරු පරීක්ෂණ මගින්

**කාර්ය ස්ථානය** : ව්‍යාපෘති කාර්යාලය, කොළඹ

(තෝරාගත් රියදුරන් ව්‍යාපෘතියේ අවශ්‍යතාවයන් අනුව වැඩබිම් තුළ සේවය කළ යුතුය.)

**අයදුම්පත් භාරගන්නා අවසන් දිනය** : 2020 ඔක්තෝබර් මස 29 වැනිද පෙරවරු 10.00

**නියම හා කොන්දේසි :**

- මෙම පත්වීම කොන්ත්‍රාත් පදනම මත වසර දෙකක් සඳහා වේ.
- ව්‍යාපෘතියේ ඉදිරි අවශ්‍යතාවය මත පමණක් කොන්ත්‍රාත් කාලය දීර්ඝ කරනු ලැබිය හැකිය. සේවය දීර්ඝ කිරීමේ හෝ අවසන් කිරීමේ පූර්ණ අයිතිය ලංකා විදුලිබල මණ්ඩලය සතුවේ.
- ලංකා විදුලිබල මණ්ඩලයේ ස්ථිර සේවකයන් බඳවා ගැනීමකදී සුදුසුකමක් ලෙස මෙම පත්වීම සලකනු නොලැබේ.

**වෙනත් ප්‍රතිලාභ :**

- තෝරාගනු ලබන අයදුම්කරුවන් සේවක අර්ථසාධක අරමුදල (EPF) සඳහා දායකත්වය ලබන අතර සේවකයාගේ මාසික වැටුපෙන් 10%ක ප්‍රතිශතයක් හා ලං.වි.ම. මගින් 15% ක ප්‍රතිශතයක් ඒ සඳහා බැර කෙරේ.
- සේවක භාර අරමුදල (ETF) සඳහා ලං.වි.ම. මගින් 3%ක ප්‍රතිශතයක් බැර කෙරේ.

අයදුම්පත් **2020 ඔක්තෝබර් මස 29 වැනිද පෙරවරු 10.00** හෝ ඊට පෙර ලැබෙන පරිදි පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළයුතුය. විද්‍යුත් අයදුම්පත් ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ. ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන ලද තනතුර පැහැදිලිව සලකුණු කළ යුතුය

ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් පරීක්ෂාවෙන් තෝරා ගනු ලබන අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලබන අතර කිසිදු ආකාරයකින් හෝ සිදු කරනු ලබන බලපෑමක්, නුසුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

දැනටමත් රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය ආයතනවල සේවය කරන අයවළුන් අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී තම අංශ ප්‍රධානියා මගින් ඉදිරිපත් කළයුතු අතර ඉහත තනතුරු සඳහා තෝරාගනු ලැබීමකදී අයදුම්කරු රැකියා ස්ථානයෙන් නිදහස් කළ හැකිද යන බව පැහැදිලිව දක්වා තිබිය යුතුවේ.

**වැඩි විස්තර :**
**ව්‍යාපෘති අධ්‍යක්ෂ (ග.බ.ව්‍යා.)**
**දුරකථන : 0112 337 635/ 0112 337 636**

**ව්‍යාපෘති අධ්‍යක්ෂ කාර්යාලය (ග.බ.ව්‍යා),**
**3 වන මහල, 65/1, ර. නි. ය. ස. ගොඩනැගිල්ල,**
**ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02.**

ලංකා විදුලිබල මණ්ඩලය
இலங்கை மின்சார சபை
CEYLON ELECTRICITY BOARD

**විදුලිබලයෙන් සසිරිමත් දිවියක්...**